# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 25 දරන ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 අප්‍රේල් මස 08 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1981 අප්‍රේල් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි. නැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1981 අංක 25 දරන ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 අප්‍රේල් මස 8 වන දින]

එල්.ඩී.—ඕ. 31/80.

**ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට්" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතිය එකඟ වූ රීති අනුව, එකී සමිතියට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කර ගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද, ඒ පරමාර්ථ හා කාරණා එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථක් ලෙස ක්‍රියාත්මක කර සහ කර ගෙන ගොස් ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 25 දරන ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසු, (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් නමැති සමිතියේ තත් කාලයේ උපදේශක මණ්ඩලයේ ජාතික අධ්‍යක්ෂවරයා සහ සාමාජිකයන්ද මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද, "ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට්" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද විය යුතු ය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, පාවිච්චි කිරීමේ හා ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ සහ අලුතු කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ද එයට ඇත්තේ ය. ශ්‍රී ලංකා කැම්පස් කෘසේඩ් ෆෝ ක්‍රයිස්ට් සංස්ථාගත කිරීම.

3. (1) සංස්ථාව— සංස්ථාවේ සාමාජිකයෝ.

(අ) සංස්ථාවේ තත් කාලයේ බල පවතින රීතිවලට අනුකූලව පත් කරනු ලැබිය යුතු ජාතික අධ්‍යක්ෂවරයකුගෙන් ; සහ

(ආ) ජාතික අධ්‍යක්ෂවරයා විසින් කලින් කල සහ සංස්ථාවේ තත් කාලයේ බල පවතින රීතිවලට අනුකූලව පත් කරනු ලැබිය හැකි තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත වන උපදේශක මණ්ඩලයකින්

සංයුක්ත විය යුතු ය.

2—ඒ48135 - 10,7000 (81/02)

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී සමිතියේ සාමාජික යන් වන තැනැත්තන් සංස්ථාවේ ප්‍රථම සාමාජිකයන් විය යුතු ය.

(අ) ගෞරවාර්හ ආනන්ද පෙරේරා—ජාතික අධ්‍යක්ෂවරයා

(ආ) ගොඩ්වින් පෙරේරා මහතා

(ඇ) රූබි ද මැල් මහත්මිය

(ඈ) රාජ්කුමාර් කරුනෙයිරත්නම් මහතා

(ඉ) රාජන් හෙන්ස්මන් මහතා

(ඊ) ලින් ලුවිස් මහතා.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

4. සංස්ථාවේ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පණිවුඩයට හවුල්කරුවකු වීම;

(ආ) සියලු ක්‍රිස්තියානි සභා සහ වෙනත් ක්‍රිස්තියානි කණ්ඩායම් සමග වැඩ කිරීම;

(ඇ) ක්‍රිස්තු භක්තිකයන්ගේ ලබ්ධිය පිළිබඳව වඩාත් ගැඹුරු දැනුමක් ඔවුන් තුළ ඇති කිරීම;

(ඈ) ප්‍රාදේශීය පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ඇති කිරීම සහ ප්‍රදේශීය සාකච්ඡා සංවිධානය කිරීම; සහ

(ඉ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස ආනුෂංගික වන හෝ ඉවහල් වන වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

5. සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ආධාර සහ පරිත්‍යාගයන් ලබා ගැනීමේ හෝ එකතු කර ගැනීමේ ද සිය අර මුදල් ආයෝජනය කිරීමේ ද සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් කිසි වක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ හෝ සියලු ක්‍රියා කිරීමේ ද සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේ ද බලය සංස්ථාවට තිබිය යුතු ය.

සංස්ථාවේ රීති

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ද සංස් ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංසථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී නියමිත වැඩි ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු, එකී රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම එවැනිම රැස්වීමකදී කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දින සිට බල පවත්නා සමිතියේ රීති සංස්ථාවේ ප්‍රථම රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

විශ්වාසය පිළිබඳ ප්‍රකාශය.

7. සංස්ථාවේ කිසිම සාමාජිකයකු විසින් හෝ එහි සේවා නියුක්තයකු විසින් හෝ මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති විශ්වාසය පිළිබඳ ප්‍රකාශය පිළිගන්නා බවට අත්සන් කරනු ලැබ, එය භාර දෙනු ලබන තුරු, ඔහු විසින් තම ධුරයේ කාර්ය ආරම්භ නො කළ යුතු ය.

සමිතියෙන් ගෙවිය යුතු හා සමිතියට අය විය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වන වේලාවේ දී පවත්නා සමිතියේ සියලුම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සමිතියට අය විය යුතු සියලුම ණය, සමිතියට ගෙවිය යුතු සියලුම දායක මුදල් සහ සම්මාදම් මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් නිශ්චල හා චංචල දේපළ තබා ගත හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමට සහ තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව හා ශක්තතාව ඇත්තේ ය. තව ද එකී සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව, සංස්ථාව විසින් තබා ගත යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබීම සඳහා ක්‍රියා පටිපාටිය.

10. ජාතික අධ්‍යක්ෂවරයා හෝ, ඔහු නොමැති විටක දී, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට තමා විසින් ලියවිල්ලකින් නම් කරන ලද සාමාජිකයකු සහ සංස්ථාවේ වෙනත් සාමාජිකයකු ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට ස්වාධීනව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මඟින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

(7 වන වගන්තිය)

## උපලේඛනය

### විශ්වාසය පිළිබඳ ප්‍රකාශය

අපගේ ඇදහීම් පිළිබඳ හුදු පදනම නම් බයිබලයත්, දෙවියන් වහන්සේගේ නොවරදින ලිඛිත භාෂිතයත්, අලුත් සහ පරණ ගිවිසුම්වලට ඇතුළත් පොත් හැටහයත් යන මේවාය. එය අතිවිශිෂ්ට ලෙස ද, වාචිකව ද, සම්පූර්ණයෙන් ද ප්‍රබෝධනය කරනු ලැබුවේ ශුද්ධෝත්තමයාණන් වහන්සේ විසිනි. තව ද එය මුල් අත්පිටපත්වල දෝෂයෙන් තොරව ලියනු ලැබිණ, ඉන් ප්‍රකාශ කෙරෙන සෑම දෙයක් පිළිබඳවම එය අත්‍යුත්තම සහ පරම සාක්ෂිය වන්නේ ය.

න්‍යායානුකූල ඉගැන්වීම් පිළිබඳ පාවුල සීමාවන් අපි පිළිගනිමු. ඓතිහාසික වශයෙන්, මේ ඉගැන්වීම් සම්බන්ධයෙන් සියලු ක්‍රිස්තියානි ලබ්ධිකයන් අතර එකඟත්වයක් තිබේ. අපගේ ව්‍යාපාරයේ පවත්නා විශේෂත්ව ගුණය නිසා, ඕනෑම අර්ථ නිරූපනයක් කිරීමේ දී බයිබලයම පදනම් කරගන්නේ නම් සහ එවැනි කිසිම අර්ථ නිරූපනයක් දෙවියන් වහන්සේ විසින් අපට නියම කරනු ලැබ ඇති දේව සේවයට බාධාකාරී වූ ප්‍රශ්නයක් බවට පත් නොවන්නේ නම්, වෙනත් න්‍යායානුකූල කරුණුවල දී තමාගේ කැමැත්ත ප්‍රකාර නිගමනවලට බැසීමේ නිදහස දීමට අපි කැමැත්තෙමු.

අපි පහත සඳහන් පරිදි, මූලික බයිබල් ඉගැන්වීම් කෙරෙහි අපගේ විශ්වාසය තරයේ ම තහවුරු කරමු:—

1. පිතා, පුත්‍රයා, ශුද්ධාත්මයාණන් යන තුන්දෙනා වහන්සේලා තුළ සදාතනික වැඩ සිටින එකම දෙවි කෙනෙක් සිටිත්. මොවුන් වහන්සේලාට පෞද්ගලිකත්වයේ විශේෂ ලක්ෂණ ද දේවත්වයේ ලක්ෂණ ද සමානව ඇත්තේ ය.

2. ක්‍රිස්තුස් වහන්සේ වූකලී දෙවියෝය. ශුද්ධාත්මයාණන් මගින් ගැබ වැස කන්‍යාවක තුළින් උපත ලබා මාංශගත වූ ජීවමාන වචනය වන්නාහ. එහෙයින් උන්වහන්සේ මනුෂ්‍යත්වයත් දේවත්වයත් සදහටම එක් කළ තැනැත්තන්වහන්සේ ය.

3. උන්වහන්සේ පාපයෙන් මුක්ත ජීවිතයක් ගතකොට මනුෂ්‍යයන්ගේ පාප වලට වන්දි ගෙවීමක් වශයෙන් කුරුසයෙහි මරණයට පත්ව උන්වහන්සේ කෙරෙහි විශ්වාසය තබන සියල්ලන් උදෙසා ගැලවීම ලබාගත් සේක. එමගින් උන්වහන්සේ දිව්‍ය සාධාරණත්වය සපුරා ලූ සේක.

4. උන්වහන්සේ තමන් ජීවත්ව සිටියා වූ ද මියගියා වූ ද එම ශරීරයෙන්ම විශිෂ්ට ආකාරයෙන් වුව උත්ථාන වූ සේක.

5. උන්වහන්සේ ශරීරාකාරයෙන් ම ස්වර්ගාරූඪව දෙවි පියාණන්ගේ දකුණු පාර්ශ්වයෙහි වැඩ සිටින්නාහ. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයන් අතර එකම මැදිහත්කරු ද තමන් වහන්සේ වෙනුවෙන් සදාතනික යදින්නා වූ තැනැත්තා ද උන්වහන්සේම ය.

6. මනුෂ්‍යයා මුලින්ම දෙවියන් වහන්සේගේ ස්වරූපය ඇතිව මවන ලද්දේ ය. ඔහු දෙවියන්ට අකීකරු වෙමින් පව් කොට සිය මැවුම්කරුවාණන්ගෙන් වියුක්ත වූයේ ය. එම වැටීම මුළු මහත් මිනිස් සංහතියම දේව උදහසට ලක් කළේ ය.

7. මනුෂ්‍ය ස්වභාවය වූකලී දූෂිතය. එහෙයින් සකල්‍යයෙන් ම දෙවියන් වහන්සේ ප්‍රසාදයට පත් කිරීමට නුපුළුවන. සෑම මනුෂ්‍යයෙකුට ම ශුද්ධාත්මයාණන් මගින් පුනර්ජීවයක් ලැබීමට ඇත්තේ ය.

8. මනුෂ්‍යයාගේ ගැලවීම වූකලී දෙවියන් වහන්සේගේ නිදහස් වරප්‍රසාදයට මුළුමණින් සිදු වන්නක් විනා පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් හෝ මනුෂ්‍යයාගේ කාර්යයන් හෝ ආගමික වතාවත් තුළ යහපත්කම නිසා සිදුවන්නක් නොවේ. දෙවියන් වහන්සේ සිය සර්ව සාධාරණත්වය, හුදෙක් සිය ගැලවීම සම්බන්ධව ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි පමණක් විශ්වාසය තබන්නන් වෙත ආරෝපණය කරමින් එමගින් උන්වහන්සේ හමුවේ සාධාරණත්වයට පැමිණියෝ ය.

9. ශුද්ධාත්මයාණන් මගින් ජීවනය ලබන්නා වූ සියල්ලන්වම ක්‍රිස්තුස්වහන්සේ ගැලවුම්කාරයාණන් ලෙස විශ්වාස කරන මොහොතේ සිටම ගැලවීම ලැබීමේ වරප්‍රසාදයට හිමි වන්නෝ ය. මෙම සහතික කිරීම මනුෂ්‍යයාගේ දක්ෂතා මත පදනම් නොවූ අතර හුදෙක්ම දෙවියන්වහන්සේ සිය ලිඛිත වචනය ධර්ම සාක්ෂිය විශ්වාසිකයා කෙරෙහි තහවුරු කෙරේ.

10. ශුද්ධාත්මයාණන් මෙලොවට වැඩම කර ඇත්තේ ක්‍රිස්තුස්වහන්සේ හඳුන්වා දීමටත් උන්වහන්සේ ප්‍රශංසාවට පත් කිරීමටත් උන්වහන්සේගේ ගැලවීමේ කාර්යයන් මනුෂ්‍යයන්ට අදාළ කරවීමටත් ය. උන්වහන්සේ පව්කාරයන්ට සත්‍ය පහදා දී ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ වෙත ළං කොට ඔවුනට උබණ්ඩව නව ජීවනයක් ලබා දුන් සේක. මේය ආත්මික නව ජීවනය ලත් මොහොතේ සිට සිදුකර, ගැලවීම ලබන දිනය තෙක් සුරක්ෂිත කොට තබන සේක. උන්වහන්සේගේ පූර්ණත්වය ද බලය හා පාලනය ද විශ්වාසය මගින් විශ්වාසිකයා තුළ පැතිර යන්නේ ය.

11. සෑම විශ්වාසිකයෙක් විසින් ම තමන් අභ්‍යන්තරයෙහි වෙසෙන ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවය තුළ ජීවත් විය යුතු වන්නේ ය. එසේ ජීවත් වෙමින් ඔහු විසින් මානුෂික තෘෂ්ණාවන්ට ඉඩ නොදී දෙවියන්වහන්සේගේ මහිමයට ලක් වනු පිණිස මැනවින් ජීවත් විය යුතු වන්නේ ය.

12. ක්‍රිස්තුස්වහන්සේ වූකලී සියලුම ජීවතුන්ගෙන් සහ මළවුන්ගෙන් සමන්විත වූ ද ගැලවීමේ විශ්වාසය මගින් උන්වහන්සේ වෙත ඒකාබද්ධව සිටින්නා වූ ද ස්වකීය ශරීරයේ ද සමස්ත සභාවේ ද මූලිකයාණෝ ය.

13. වන්දනාමාන කිරීම පිණිසත් යාඥා යනාදියට සහභාගි වීම පිණිසත් ශුද්ධ වූ ලියවිලි මගින් සාක්ෂි දැරීම පිණිසත් අන්‍යෝන්‍ය වශයෙන් ධෛර්ය ලබා ගැනීම පිණිසත් එක්රැස් වීමට දෙවියන් වහන්සේ ස්වකීය ජනතාවට අවවාද කරන සේක.

14. ධර්මිෂ්ඨ ශාරීරික වශයෙන් මියයාමෙන් ඉක්බිතිව ම සදාතනික ජීවිතයට ඇතුළත්ව ස්වාමීන්වහන්සේ හා වෙසෙමින් උන්වහන්සේගේ ධෛර්ය ශරීරය සනාථන මහිමයට හා ආශීර්වාදයටත් හේතු යුක්තවන ලෙස පුනරුත්ථානය වන තෙක් බලාපොරොත්තුව සිටින්නෝ ය.

15. ශාරීරික වශයෙන් මියයාමේ අධර්මිෂ්ඨ සදාතනික ජීවයට ස්වාමීන්වහන්සේගෙන් වියුක්තව ඇතුළත්ව උන්වහන්සේගේ පුනරුත්ථානය හා අවසාන විනිශ්චය හා තීන්දුව දෙන තෙක් රැඳී සිටින්නෝ ය.

16. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඉතිහාසය හා දෙවියන්වහන්සේගේ සැලැස්ම පරිපූර්ණත්වයට පත් කරනු වස්—පෞද්ගලික වශයෙන් ද දෘශ්‍යමානව ද ශාරීරික වශයෙන් ද—මිහිතලය මතට වැඩම කරන සේක.

17. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සියලු විශ්වාසිකයන්ට මුළු ලොව පුරා සුභාරංචි පතළ කරවීමටත් සකල ජනතාවගේ මග පෙන්වීමටත් නියෝග කළ සේක. ඒ උත්කෘෂ්ට කාර්ය සපුරාලීම සඳහා සියලු ලෞකික හා පෞද්ගලික ආශාවන් යටපත් කොට "අපට ප්‍රේම කළා වූ ද අප වෙනුවෙන් දිවිපිදුවා වූ ද උන්වහන්සේට කැප වීම" අවශ්‍ය වන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.